ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

11 ශ්‍රේණිය

නිපුණතාව - 8.0, 9.0

ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ආයෝජනය

Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

පටුන

	පිටු අංකය
• ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන	3 - 4
• ගැලපුම් සටහන්	5
• ලාභ අරමුණු කර නොගත් සංවිධාන	6
• නිෂ්පාදන පිරිවැය ලේඛණය	7 - 9
• ආයෝජන	10

Copyright © www.e-thaksalawa.moe.gov.lk

• ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන

(1) i. තනි පුද්ගල ව්‍යාපාරයක් විසින් පිළියෙළ කරන මූල්‍ය ප්‍රකාශන නම් කරන්න.
ii. ඒ එක් එක් මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීමේ මූලික අරමුණ ලියන්න.

(2) ගිණුම්කරණ ක්‍රියාවලියේ පියවරයන් පිළිවෙළින් ලියන්න.

(3) ව්‍යාපාරයක පහත තොරතුරු උපයෝගී කරගෙන විකුණුම් පිරිවැය ගණනය කරන්න.

ආරම්භක තොගය	රු.12,000
ගැනුම්	රු.150,000
අවසන් තොගය	රු.10,000
ගෙන ඒමේ කුලිය	රු.2,000
පැටවීමේ කුලී	රු.500
භාණ්ඩ ගැනිලි	රු.1,000

(4) ව්‍යාපාරයක පහත තොරතුරු උපයෝගී කරගෙන එම ව්‍යාපාරයේ දළ ලාභය ගණනය කරන්න.

ගැනුම්	රු.200,000
විකුණුම්	රු.300,000
ආරම්භක තොගය	රු.25,000
අවසාන තොගය	රු.30,000
ගෙන ඒමේ කුලී	රු.3,000

(5) I. 'හිමිකම' යන්න හඳුන්වන්න.
II. වගකීමක ලක්ෂණ 2ක් සඳහන් කරන්න.
III. 'හිමිකම' වැඩිවෙන ගණුදෙනු 2ක් ලියන්න.

(6) පහත සඳහන් වියදම් බෙදාහැරීමේ, පරිපාලන, වෙනත් හා මූල්‍ය යන ශීර්ෂ වලට වර්ගකර දක්වන්න.

වැටුප් ගෙවීම	විදුලි වියදම්	ලී බඩු ක්ෂය
රක්ෂණය	ජල ගාස්තු	වෙළෙඳ සේවක
වැටුප්		
ප්‍රචාරණය	පරිත්‍යාග	ලිපි ද්‍රව්‍ය වියදම්
ප්‍රවාහනය	බැංකු අයිරා පොළී	කඩ කුලී
මෝටර් රථ ක්ෂය	තොග හානි	මුදල් වංචා අලාභ
යන්ත්‍ර ක්ෂය	වරිපනම් බදු	දුන් වට්ටම්
බැංකු ණය පොළී	බොල් ණය	

Copyright © www.e-thaksalawa.moe.gov.lk

(7) පහත සඳහන් තොරතුරු ජංගම නොවන වත්කම්,ජංගම වත්කම්,ජංගම නොවන වගකීම්, ජංගම වගකීම් හා හිමිකම් යන ශීර්ෂ යටතේ වර්ග කර දක්වන්න.

ඉඩම් ගොඩනැගිලි	ලී බඩු උපකරණ	බැංකු මුදල්
මෝටර් රථ	බැංකු ණය	ස්ථාවර තැන්පතුව
ණය ගැතියෝ	බැංකු අයිරා	ලැබිය යුතු පොළී
යන්ත්‍ර සූත්‍ර	ශුද්ධ ලාභය	අතැති මුදල්
ණය හිමියෝ	උකස් ණය	ලැබිය යුතු කුලී
ගැනිලි	ගෙවිය යුතු රක්ෂණය	ප්‍රාග්ධනය
ගෙවිය යුතු විදුලි බිල්	අවසාන තොගය	

(8) සහන් ගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2019/12/31 දිනට පිළියෙළ කල ශේෂ පිරික්සුම පහත දැක්වේ.

ගිණුමේ නම	හර(රු)	බැර(රු)
ගැනුම්	285000	-
විකුණුම්	-	475000
මෝටර් රථ (පිරිවැයට)	350000	-
ගොඩනැගිලි (පිරිවැයට)	400000	-
මෝටර් රථ ක්ෂය වෙන් කිරීම්	-	5000
2019.01.01 තොගය	18000	-
දුන් වට්ටම්	1500	-
ලද වට්ටම්	-	6000
ගෙන ඒමේ කුලී	2500	-
විදුලිය	12000	-
ප්‍රචාරණය	18000	-
සේවක වැටුප්	25000	-
ස්ථාවර තැන්පතු 12%	50000	-
ස්ථාවර තැන්පතු පොළී	-	2500
ණය ගැතියෝ	20000	-
ණය හිමියෝ	-	32000
බැංකු ගාස්තු	1000	-
ගැනිලි	2000	-
මුදල්	3000	-
ගෙවල් කුලී	15000	
2019.01.01 දිනට ප්‍රාග්ධනය	-	682500
	1203000	1203000

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අමතර තොරතුරු පහත දැක්වේ
I. 2019.12.31 දිනට බඩු තොගය රු.13000කි.
II. ගොඩනැගිලි 10%ක් ද මෝටර් රථ 12%ක් ක්ෂය කරන්න.

අවශ්‍ය වන්නේ

(අ) 2019.12.31 දිනෙන් අවසන් වසර සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
(ආ) 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

• ගැලපුම් සටහන්

(1)පහත සඳහන් තොරතුරු වලට අදාළ ගැලපුම් සටහන් පොදු ජ'නලයක සටහන් කර අදාළ ලෙජර් ගිණුම් වලට පිටපත් කරන්න.

I. වාර්ෂික විදුලි ගාස්තුව රු:9,000/ක් වුවද වසර අවසන් වන දිනට මුදලින් ගෙවා තිබුනේ රු:5,000/ක් පමණි.
II. වාර්ෂික වේතන රු:120,000/ක් වුවද මුදලින් ගෙවා තිබුනේ රු 110,000/කි.
III. බැංකු ණය පොළිය වර්ෂයට රු 100,000/ක් ගෙවිය යුතු වුවද රු 150,000/ක් මුදලින් ගෙවා තිබුණි.
IV. වාර්ෂික කොමිස් ආදායම රු 45,000/ක් වුවද මුදලින් ලැබී තිබුනේ රු 32,000/ ක් පමණි.
V. රු 50,000/ක කඩ කුලී ආදායමක් මෙම වසරට ලැබිය යුතු වුවද ලැබී තිබුනේ රු 36,000/කි.
VI. රු 400,000/ක් වූ යන්ත්‍රය මෙම වසරට 10%ක් ක්ෂය කරන්න.
VII. රු 2,000,000/- ක් වටිනා මෝටර් රථය 10%බැගින් ක්ෂය කරනු ලැබේ.

(2)
I. වත්කම "ක්ෂයවීම"යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?
II. වත්කම පිරිවැයට ඇතුලත් කළහැකි වියදම් මොනවාද?
III. සරල මාර්ග ක්ෂය ක්‍රමය පැහැදිලි කරන්න.
IV. යන්ත්‍රයකට අදාළ පහත තොරතුරු ඔබට සපයා ඇත.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

යන්ත්‍රයේ ගැනුම් මිළ	රු: 1,500,000
යන්ත්‍රය ගෙන ඒමේ කුලිය	රු: 10,000
සවි කිරීමේ ගාස්තු	රු: 10,000
සුන් බුන් අග	රු: 20,000
ප්‍රයෝජනවත් ජීව කාලය	වසර 10

මෙම යන්ත්‍රයට අදාළව -

(අ) පිරිවැය ගණනය කරන්න.

(ආ) ක්ෂය කල හැකි අගය ගණනය කරන්න.

(ඇ) සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ක්ෂය ප්‍රමාණය ගණනය කරන්න.

(ඉ) ක්ෂය ගිණුම්ගත කිරීමට ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.

- **ලාභ අරමුණු කර නොගත් සංවිධාන**

(1) ලාභ අරමුණු කර නොගත් සංවිධාන වල ලැබීම් හා ගෙවීම් ගිණුම් පිළියෙළ කිරීමේ අරමුණු මොනවාද?

(2) "ලලනා" කාන්තා සමිතියේ 2019 වර්ෂයේ සිදු වු මුදල් ලැබීම් හා ගෙවීම් වලට අදාල තොරතුරු පහත දැක්වේ.

සාමාජික ගාස්තු ලැබීම්	18000/=
පරිත්‍යාග ලැබීම්	6000/=
කොඩි විකිණීමෙන් ලැබීම්	12000/=
ප්‍රවාහන වියදම්	1000/=
පරිත්‍යාග ගෙවීම්	1200/=
පොළී ලැබීම්	4800/=
ලිපි ද්‍රව්‍ය ගෙවීම්	500/=

ඉහත තොරතුරු ඇසුරින් "ලලනා" කාන්තා සමිතියේ 2019 වසර සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම් පිළියෙළ කරන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

(3) පහත සඳහන් වන්නේ "ජය නියත" ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුමයි.

"ජය නියත" ක්‍රීඩා සමාජය

2019/12/31 න් අවසන් වසර සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම.

විස්තරය	මුදල(රු)	විස්තරය	මුදල(රු)
2019.1.1ශේෂය ඉ/ගෙ	20000	ගොඩනැගිලි කුලී	4000
සංවත්සර ආදායම	6000	සේවක වේතන	16000
මුදල් පරිත්‍යාග ලැබීම්	12000	විදුලි ගාස්තු	2000
සාමාජික මුදල්	48000	දුරකථන ගාස්තු	1000
		ක්‍රීඩා උපකරණ මිලට ගැනීම	22500
		2019/12/31ශේෂය ප/ගෙ	40500
	86000		86000
2020.01.01 ශේෂය ඉ/ගෙ	40500		

<u>අතිරේක තොරතුරු</u>

I. 2019.1.1 දිනට ක්‍රීඩා උපකරණ වල වටිනාකම රු 5000 වන අතර වර්ෂය අවසානයේ එහි වටිනාකම රු.25000/=ක් ලෙස තක්සේරු කර ඇත.

II. මෙම ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 500ක් වන අතර වාර්ෂික සාමාජික ගාස්තුව රු 100කි.

III. දුරකථන ගාස්තුව රු 500ක් උපචිතව ඇත.

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම් පිළියෙල කරන්න.

- **නිෂ්පාදන පිරිවැය ලේඛණය**

(1) නිෂ්පාදන පිරිවැය හඳුන්වන්න.
(2) නිෂ්පාදන පිරිවැය මූලිකාංග මොනවාද?
(3) ප්‍රාථමික පිරිවැය තුල අඩංගු වන පිරිවැය වර්ග මොනවාද?
(4) පහත සඳහන් වන්නේ ඇඟලුම් නිෂ්පාදන ආයතනයක එක්තරා කමීසයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් දරා ඇති වියදම් සමූහයකි.

රෙදි ගැනුම් වියදම්	කම්හල් මුරකරු වැටුප්	යන්ත්‍ර ක්ෂය
බැජ් මිලදී ගැනුම්	බොත්තම් මිලදී ගැනුම්	නූල් මිලදී ගැනුම්
රෙදි මසන්නන්ගේ වැටුප්	සුපරීක්ෂක වැටුප්	යන්ත්‍ර
අළුත්වැඩියා		
කම්හල් කළමනාකරුගේ වැටුප්	කම්හල් කුලී	කම්හල් රක්ෂණ
කම්හල් ලිපිකරු වැටුප්	විදුලි වියදම්	

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ඉහත සඳහන් වියදම් සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය, සෘජු වෙනත් පිරිවැය,වක්‍ර ද්‍රව්‍ය පිරිවැය,වක්‍ර ශ්‍රම පිරිවැය හා වෙනත් වක්‍ර පිරිවැය ලෙස වර්ග කරන්න.

නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම.

(01) ප්‍රාථමික පිරිවැය=සෘජු ද්‍රව්‍ය+සෘජු ශ්‍රමය+සෘජු වෙනත්

(02) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය=වක්‍ර ද්‍රව්‍යය+වක්‍ර ශ්‍රමය+වක්‍ර වෙනත්

(03) මුළු නිෂ්පාදන පිරිවැය=ප්‍රාථමික පිරිවැය+ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය

(04) $\text{ඒකක පිරිවැය} = \dfrac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිෂ්පාදන ඒකක ප්‍රමාණය}}$

(05) ඒකකයක විකුණුම් මිළ=ඒකකයක පිරිවැය+ඒකකයක ලාභාන්තිකය

සම්පත් දායකත්වය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : ඩී.එම්.සී. කුමාර මයා - ශ්‍රී රතනපාල මහා විද්‍යාලය - ආණමඩුව

Copyright © www.e-thaksalawa.moe.gov.lk

➢ ප්‍රශ්න

(1)කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරන එක්තරා සබන් වර්ගයකට අදාල පිරිවැය පහත දැක්වේ.

- ප්‍රාථමික පිරිවැය- රු.200000/=
- නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය- රු.300000/=
- නිෂ්පාදිත ඒකක ගණන-රු.25000/=

ඒකකයක ලාභාන්තිකය 30% ක් නම්

I. මුළු නිෂ්පාදන පිරිවැය
II. ඒකක පිරිවැය
III. ඒකකයක ලාභාන්තිකය
IV. සබන් කැටයක විකුණුම් මිළ ගණනය කරන්න.

නිර්මාල් විසින් ඉවතලන ප්ලාස්ටික් බෝතල් භාවිතයෙන් මල් පෝච්චි නිපදවා විකුණන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2019 මාර්තු මස ඔහුගේ නිෂ්පාදන වලට අදාල තොරතුරු පහත දැක්වේ.

ප්ලාස්ටික් බෝතල් මිළට ගැනුම්	-	රු.13000
මල් පෝච්චි හදන්නන්ගේ වැටුප	-	රු.6000
මල්පෝච්චි තීන්ත ගෑමේ වියදම්	-	රු.2500
විදුලි වියදම්	-	රු.3000
මල් පෝච්චි නිෂ්පාදන යන්ත්‍රය මිලදීගැනීම	-	රු.60000

<u>අතිරේක තොරතුරු.</u>

➢ යන්ත්‍රය සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10%ක් ක්ෂය කල යුතුය.
➢ සියළුම අමුද්‍රව්‍ය භාවිත කරමින් මාසය තුල නිපදවන ලද මුළු මල් පෝච්චි ගණන 100කි.

<u>අවශ්‍ය වන්නේ.</u>

2019/03/31 න් අවසන් මාසය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛණයක් සකස් කරන්න.(ලකුණු-02)
(2019/dec-
O/L)

(2)පොත්පත් මුද්‍රණයේ යෙදී සිටින සචින් 2020 ජනවාරි මස එක්තරා පොතක් මුද්‍රණයට අදාලව දරන ලද පිරිවැය තොරතුරුමෙසේය.

කඩදාසි	-	රු.19000
යන්ත්‍ර පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය	-	රු.20000
ලිහිසි තෙල්	-	රු.3000
පොත් බඳින්නාට ගෙවූ වැටුප	-	රු.12000
කර්තෘ භාගය	-	රු.15000
සුපරීක්ෂණ වේතන	-	රු.20000
කම්හල්රක්ෂණ	-	රු.2500
කම්හල් විදුලිය	-	රු.1500

නිෂ්පාදිත ඒකක ගණන 500ක් වන අතර ඒකකයකින් 10 % ක ලාභාන්තිකයක් තබා ගනී.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අවශ්‍ය වන්නේ.

(අ)මුළු නිෂ්පාදන පිරිවැය

(ආ)ඒකක පිරිවැය

(ඉ)ඒකකයක විකුණුම් මිළ ගණනය කරන්න.

(3)අල්මාරි නිෂ්පාදනය කර අලෙවි කරන සඳුන්ගේ ව්‍යාපාරයේ 2018 නොවැම්බර් මසට අදාල තොරතුරු පහත දැක්වේ.

දැවවල පිරිවැය	-	රු.100000
මාසික විදුලි බිල	-	රු. 2500
වඩුවාගේ වැටුප්	-	රු. 60000
අනෙකුත් සෘජු වියදම්	-	රු. 17500
වඩු කර්මාන්ත ශාලා කුලී	-	රු. 20000

නොවැම්බර් මස නිපදවන ලද අල්මාරි ගණන 5කි. අල්මාරියක විකුණුම් මිල රු.50000කි.

අවශ්‍ය වන්නේ.

(අ) නොවැම්බර් මාසය සඳහා ප්‍රාථමික පිරිවැය.

(ආ)අල්මාරියක් විකිණීමෙන් ලැබෙන ලාභය. (ලකුණු-02) (2018/dec-O/L)

(4) එකම වර්ගයේ මල්පෝච්චි නිෂ්පාදනය කරන ව්‍යාපාරයක 2016 මැයි මාසයට අදාල තොරතුරු පහත දැක්වේ.

නිෂ්පාදිත ඒකක ගණන	-	රු.100/=
සෘජු වියදම්	-	රු.30000/=
මල්පෝච්චි ප්‍රවාහන වියදම්	-	රු.5000/=
ඒකකයක නිෂ්පාදන පිරිවැය	-	රු.400/=

විකුණුම් මිළ තීරණය කරනු ලබන්නේ පිරිවැයට 25% ක ලාභාන්තිකයක් තබාගෙනය.

අවශ්‍ය වන්නේ.

(අ) 2016 මැයි මාසය සඳහා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය.

(ආ) ඒකකයක විකුණුම් මිළ . (ලකුණු-02)(2016/dec-O/L)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ආයෝජනය

(1)

I. ආයෝජනය යන්න හඳුන්වන්න.
II. ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක මොනවාද?
III. ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කිරීමෙන් ඇති වාසි මොනවාද?
IV. සමාගමක කොටසක් ලෙස හඳුන්වන්නේ කුමක්ද?
V. සාමාන්‍ය කොටස් වල ආයෝජනය කිරීමෙන් ඇති වාසි 4ක් ලියන්න.
VI. භාණ්ඩාගාර බිල් පතක් යනු කුමක්ද?
VII. භාණ්ඩාගාර බිල් පත් වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද?
VIII. ආයෝජනයේදී අවධානම හා ප්‍රතිලාභ (risk and return) අතර පවත්නා සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(2) වැඩි අවදානමක් ගැනීමට අකමැති රත්නා, වසරකට පෙර ඔහු රු.1200,000/කට මිලදී ගත් ඉඩමක් රු.1500,000/ කට විකුණුවේය. ඇය මේ මුදල් ලබන මාසය වන විට ඇගේ දුවගේ උසස් අධ්‍යාපන කටයුතු වලට වියදම් කිරීමට බලාපොරොත්තු වේ.

(අ).ඉඩම විකිණීමේ ගනුදෙනුවෙන් රත්නා ලැබූ ප්‍රතිලාභයේ වටිනාකම කොපමණද?
(ආ) ඉහත (ආ)හි සඳහන් ප්‍රතිලාභ හැඳින්වීමට භාවිතා කරන නම කුමක්ද?
(ඇ) ඇයගේ දුවගේ අධ්‍යාපන කටයුතු වලට මුදල් භාවිතයට ගන්නා තුරු එම මුදල් ආයෝජනය කිරීමට වඩාත්ම සුදුසු ආයෝජන මාර්ගය කුමක්ද?
(ඈ) ඉහත (ඇ) හි ඔබ දෙන ලද පිළිතුරට හේතු දක්වන්න. .

(ලකුණු 02)
(2018-Dec/O/L)

(3) වැඩි අවධානමක් ගැනීමට අකමැති බණ්ඩාර, ලබන මස විශ්‍රාම යාමට බලාපොරොත්තු වේ. ඔහු විශ්‍රාම යාමේදී, ඔහුට ලැබෙන රු. 3000000 සේවක අර්ථසාධක අරමුදල පහත සඳහන් ආයෝජන මාර්ග දෙකෙහි ආයෝජනය කිරීමට සලකා බලමින් සිටී.

I. ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුමක 15%ක පොළියට ස්ථාවර තැන්පතුවක තැන්පත් කිරීම
II. 25% වාර්ෂික අපේක්ෂිත ප්‍රතිලාභයකට කොටස් වෙළෙඳපොලේ සාමාන්‍ය කොටස් වල ආයෝජනය කිරීම

(අ) ඉහත ආයෝජන මාර්ග වලින්, බණ්ඩාරට ආයෝජනය කිරීම සඳහා ඔබ නිර්දේශ කරනුයේ කුමක්ද?

(ආ) ඔබේ ඉහත තේරීමට හේතු දක්වන්න.

සම්පත් දායකත්වය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : ඩී.එම්.සී. කුමාර මයා - ශ්‍රී රතනපාල මහා විද්‍යාලය - ආණමඩුව

Copyright © www.e-thaksalawa.moe.gov.lk